# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2383/05 - 2024 මැයි මස 06 වැනි සඳුදා - 2024.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/73 (XII) (A)

**(469 වන අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත**

2 වන වගන්තිය යටතේ වූ නියමය

(469 වන අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන සහ (4) වන උපවගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි වන මා විසින්, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති භූමි ප්‍රදේශය, මේ නියමය පළකරනු ලබන දින සිට බලපැවැත්වෙන පරිදි, 2016 මාර්තු මස 01 වන දින අංක 1956/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනයේ විස්තර කර ඇති "වෙඩිතලතිව් ස්වභාව රක්ෂිතය" යන්නෙහි කොටසක් ලෙස පැවතීම අවසන් විය යුතු බවට සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ප්‍රදේශය බැහැර කිරීමෙන් පසුව ඉතිරිවන භූමි ප්‍රදේශය "වෙඩිතලතිව් ස්වභාව රක්ෂිතය" යනුවෙන් හඳුන්වනු ලබන බවට සහ සඳහන් කරනු ලබන බවට, මේ නියමය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය.

2024 මැයි මස 03 වැනි දින,
කොළඹ දී ය.

1A - G 41894 — 05 (2024/05)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


උපලේඛනය


*"වෙඩිතලතිව් ස්වභාව රක්ෂිතයෙන්" ඉවත් කරන ලද භූමි ප්‍රදේශයේ සීමාවන්*

1:4000 පරිමාණය මත පදනම්ව ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද පහත දක්වා ඇති 2022 ජනවාරි මස සිට 2022 මාර්තු මස දක්වා දිනැති අනුරේඛන අංක Ma/MNW/2022/07 සහ මැනුම් අංක MN/MW/1/SR/2020/130 හි A, B, C, D, E, F, G, H, J, K, L, M, N, P, Q, R, S, T, U, V, X, Y, Z, AA, AB, AC, AD, AE, AF, AG, AH, AI, AJ, AK, AL, AM, AN, AO, AP, AQ, AR, AS, AT සහ AU යන කැබලි අංක මගින් නිරූපිත එකී අනුරේඛනයට අනුව හෙක්ටයාර් 168.556 ක ප්‍රමාණයකින් සමන්විත වන්නා වූ සම්පූර්ණ භූමි ප්‍රදේශය.

අනුරේඛන අංක Ma/MNW/2022/07






EOG 05 - 0053

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.